**ශීර්ෂය - 10 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳවමාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 09 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේවගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේමූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

**(අ) දේපල පිරියත හා උපකරණ**

-------------------------------

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.28,975,000 ක්වූ වාහන 05 ක් අයිතිය පවරා ගැනීමකින් තොරව 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධනිත කර තිබුණි. | මෙම මෝටර් රථ 05 හි අයිතිය පැවරීමට අදාල ලියාපදිංචි සහතික මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් 2022.04.25 දින ආයතනය වෙත එවා ඇත. | වාර්තාකරන දිනට අයිතිය පවරාගත් වාහන පමණක් ප්‍රාග්ධනිත කළ යුතුය |

**(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

-----------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද රු.332,640 ක්වූ වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් යටතේ දක්වා නොතිබුණු අතර පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් යටතේ දක්වා තිබුණි. | මෙය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් වැය ශීර්ෂයන්ගෙන් ලැබීම් වල සටහන් කර ඇති අතර මෙය වෙනත් ආදායම් ශීර්ෂ මඟින් වූ ලැබීමකි. | වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනම දැක්විය යුතුය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---

| නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව විසින් සකස් කර ඇති වාහන අනතුරු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | වාහන අනතුරු ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන අතර දැනට අසම්පූර්ණ කොටස් මුදල් රෙගුලාසි 104 පරීක්ෂණ වාර්තා ලද පසුව සම්පූර්ණ කරනු ලැබේ. | වාහන අනතුරු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වාගත යුතු වේ. |

**(ඉ) විගණන සාක්ෂි නොවීම**

---

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.41,015 ක් වූ වාහන අනතුරු සිදුවීම් 05ක් සම්බන්ධයෙන් පාඩු හා හානි වලට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුනි. | වාහන වල අංක සඳහන් නොවන බැවින් පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීම අපහසු වේ. | වාහන අනතුරු ලේඛනයේ වටිනාකම් සහිතව වාර්තා කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 අල්ලස් වැටලීම්වල -අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට රු.998,330ක අත්තිකාරම් සම්බන්ධයෙන් නඩු තීන්දු ප්‍රකාශයට පත් කර තිබුණද විගණිත දිනය වන 2022 අප්‍රේල් 05 දිනට වසරකට අධික කාලයක් ගතව තිබුණත් එම අත්තිකාරම්, සරප් වෙත නිරවුල් කර නොතිබුණි. | එම අත්තිකාරම් නිරවුල් කිරීමට අදාලව කටයුතු කරමින් පවතී. | නඩු කටයුතු හා අභියාචනා අවසන් වූ පසුව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය | | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත මුල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එම වාර්තාව දින 51 ක් ප්‍රමාදවී ඉදිරිපත් කර තිබුණි. | ඉදිරි වසර වලදී එහි කෙටුම්පත මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන විට ඔබ වෙත එවීමට කටයුතු කරනු ලැබේ. | කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | මුදල් රෙගුලාසි 371(2) හා 371(5) | 44,000 | අවස්ථා 06 කදී ලබාදී තිබුණු එකතුව රු.44,000 ක්වූ තත්කාර්යය අතුරු අග්‍රිම ප්‍රමාද කර පියවා තිබුණි. | විමර්ශන නිලධාරීන්ගේ නඩු කටයුතු හා විමර්ශන රාජකාරී හේතුවෙන් ඔවුන්ගේ කාර්යබහුලත්වය මත අත්තිකාරම් පියවීම ප්‍රමාද වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | **2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය**<br>(i) 3.1.5 ඡේදය | සෑම මුදල් වර්ෂයකම පෙබරවාරි 26 දිනට පෙර පොදු 47 වාර්තාව අනුව විනාශ කළ යුතු, අලුත්වැඩියා කළ යුතු, විකිණිය යුතු හා වෙනත් රජයේ ආයතනනවලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කර මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ මාර්තු 30 දින භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | කොවිඩ් වසංගත තත්වය නිසාභාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත දිනට ඉටුකර ගැනීමට නොහැකි විය | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) ඡේදය3.1.6 | 2020 වර්ෂයේ නඩු භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මාස 04 ක ප්‍රමාදයක් සහිතව විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | කොවිඩ් වසංගත තත්වය නිසා නඩු භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත දිනට ඉටුකර ගැනීමට නොහැකි විය | චක්‍රලේඛය ප්‍රකාරව මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කාර්යසාධනය

----------------

| | | |
|---|---|---|
| කොමිෂන් සභාව විසින් පවරන ලද නඩුවලින් 2019 හා 2020 වර්ෂවලදී නඩු 10 ක් විවිධ හේතු මත ඉල්ලා අස්කරගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී නඩු 39 ක් ඉල්ලා අස්කරගෙන තිබුණි. එම නඩු 39 න් 2015 වර්ෂයට පෙර පවරන ලද නඩු 5 ක් වූ අතර 2019 වර්ෂයේදී පවරන ලද නඩු 2 ක් විය. ඉතිරි නඩු 32, 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පැවරූ නඩු විය. | මෙම නඩු ඉල්ලා අස්කරගෙන ඇත්තේ නඩුවල පැවති තාක්ෂණික දෝෂ මගහරවාගෙන නැවත නඩු පැවරීම පිණිසයි. | ඉල්ලා අස්කරගෙන ඇති නඩුවල පැවති තාක්ෂණික දෝෂ මගහරවාගෙන නැවත නඩු පැවරීම කළ යුතු වේ. |

### 3.2 ප්‍රසම්පාදනයන්

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **ආරක්ෂක තාප්පය සඳහා විදුලි සැපයුම් පද්ධතිය සකස් කිරීම** | | |
| **(i)** | රු.1,903,348 කට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ප්‍රදානය කර තිබුණු මෙම කොන්ත්‍රාත්තුවට අදාලව කිසිදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | මෙය රජයේ ආයතන 02 ක් අතර අන්නොන්‍යා අවබෝධය මත කටයුතු කිරීමක් වන බැවින් ගිවිසුම් අත්සන් කිරීමක් සිදු කර නැත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ඡේදය ප්‍රකාරව රු.250,000 ඉක්මවන වැඩ කොන්ත්‍රාත් සඳහා වූ යම් |

| | | | |
|---|---|---|---|
| | | | කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වේ. |
| **(ii)** | මෙම කොන්ත්‍රාත්තුවට අදාලව කොන්ත්‍රාත්කරුවෙකුට කරන ගෙවීම්වලින් නිශ්චිත මුදලක් රඳවා තබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ගෙවීමට අදාල රැඳවුම් මුදල් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ගිණුමේ රඳවා ගත් බව එම දෙපාර්තමේන්තුව දන්වා ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 (අ) ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවෙකුට කරන ගෙවීම්වලින් නිශ්චිත මුදලක් රඳවා තබා ගත යුතු වේ. |
| **(iii)** | මෙම කොන්ත්‍රාත්තුවට අදාලව ප්‍රසම්පාදන කාර්යය ආරම්භයේ සිට නිසි සැලසුමකින් තොරව ක්‍රියා කිරීම හේතුවෙන් අවස්ථා 02 කදී මිල ගණන් කැඳවීම, නැවත ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හරහා අදාල කාර්යය සිදු කිරීම, ප්‍රධාන කණුවල විදුලි පහන් නිර්මාණය හා කුඩා කණු සඳහා මිල ගණන් කැඳවීම ආදී කටයුතු වරින් වර සිදු කර තිබුණි. | තාප්පයේ මූලික සැලසුම සහරාන්ගේ බෝම්බ ප්‍රහාරය හේතුවෙන් වෙනස් කිරීමට සිදුවීම, මූලික සැලසුම්වල තිබුණු විදුලි පහන් වෙළඳපොලේ නොතිබීම හා පවත්නා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත් හේතුවෙන් වරින් වර මිල ගණන් කැඳවීමට සිදුවිය. | නිසි සැලසුමක් සහිතව කාර්යයන් ආරම්භ කළ යුතු වේ. |
| **(iv)** | මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත 2021 දෙසැම්බර් 16 දින රු.1,903,348 ක් ගෙවා තිබුණු අතර එහි කළ වැඩවල වටිනාකම සියයට 80 ක් බව සඳහන්ව තිබුණි. විගණිත දිනය වන 2022 අප්‍රේල් 08 දින වන විටත් ඉතිරි කාර්යයන් නිම කර නොතිබුණි. | මේ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින් මෙම වසරේදී මෙම කාර්යය නිම කිරීමට නොහැකි විය. | කාර්යය හැකි ඉක්මනින් ඉටුකරවා ගත යුතු වේ. |
| **(ආ)** | **නව ගබඩා කාමරයක් සකස් කිරීම** | | |
| **(i)** | මෙම කොන්ත්‍රාත්තුව සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.156,353 ක් ගෙවා තිබුණද ඒ සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් විස්තරාත්මක බිල්පතක් නොතිබුණි. | රු.156,353 ක් ගෙවා ඇත්තේ අතුරු බිල්පතකටයි. ඒ බව වවුචර් පතේ සඳහන් වේ. මේ සඳහා අවසාන හා විස්තරාත්මක බිල්පත 2022.01.26 දින ලබාදී ඇත. | ගෙවීම් කිරීමේදී විස්තරාත්මක බිල්පතක් ලබා ගෙන පරීක්ෂා කිරීමෙන් පසුව ගෙවීම් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | රු.614,200 ක්වූ මෙම කොන්ත්‍රාත්තුවට අදාලව කිසිදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | මෙය රජයේ ආයතන 02 ක් අතර අන්නොන්‍යා අවබෝධය මත කටයුතු කිරීමක් වන බැවින් ගිවිසුම් අත්සන් කිරීමක් සිදු කර නැත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 8.9.1(ආ) ඡේදය ප්‍රකාරව රු.250,000 ඉක්මවන වැඩ කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කළ යුතු වේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ මූල්‍ය කල්බදු පදනම යටතේ ලබා ගත් වාහන 05 ක කල්බදු කාලය අවසන්වී වසරක් පමණ ගතවී තිබුණද එම වාහන පවරාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | එම වාහන 05 ට අදාල සියළු ලේඛන සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මෙම කොමිෂන් සභාව වෙත පැවරීම සිදු කිරීමට මෝටර් රථ කොමසාරිස් ජනරාල් වෙත 2021.01.21 දින භාරදී ඇත. | කල්බදු කාලය අවසන් වූ වහාම එම වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 3.4 පාඩු හා හානි

-------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ සිට2019 වර්ෂය දක්වා කාල සීමාව තුල සිදු වු වටිනාකම රු.274,612ක්වු වාහන අනතුරු 11කට අදාල පාඩු හා අත්හැරීම් සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධව අය කර ගැනීමට හෝ එසේ නොමැති නම් කපා හැරීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කල යුතු වේ. |
| (ආ) | කොමිෂන් සභාවට අයත් වාහනයකට සිදු වු රු.8,965 ක්වූ අලාභය කපාහැරීමට කටයුතුකර ඇති බව විගණනයට ඉදිරිපත් කළ උපලේඛණය මගින් දක්වා තිබුණද, | මෙම රථයේ මු.රෙ.104(1) මූලික විමර්ශන වාර්තාව මේවන විට ලැබී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කරනු ලැබේ. | විගණනයට නිවැරදි තොරතුරු ඉදිරිපත් කල යුතු අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා හානි ලේඛණයේ තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු ලෙස දක්වා තිබුණි.

## 3.5 කළමනාකරණ දුර්වලතා

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 මාර්තු 01 දින අග්‍රාමාත්‍ය කාර්යාලයේ පැවති ආර්ථික කළමනාකරණ කැබිනට් කමිටුව මඟින් මලලසේකර මාවතේ, අංක 36/69 සී දරන භූමිය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පවරා දීමට තීරණය වී තිබූ නමුත් එම භූමියේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට 2022අප්‍රේල් 30දින වන විටත් නොහැකි වී තිබුණි. | ඉඩමේ අයිතිය පවරා ගැනීමට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් කළද ඉඩම පවරා දීමට විරුද්ධ බව නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා ඇති බැවින් මෙම කටයුතු ප්‍රමාදවී ඇත. | භූමියේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | නඩු තීන්දු ලබාදී වර්ෂ ගණනාවක් ගතවූ නඩුවලට අදාල නඩු භාණ්ඩ අයිතම 05 ක් නඩු භාණ්ඩ නිලධාරියා භාරයේ පැවතුනි. | මෙම නඩු භාණ්ඩ අධිකරණ භාරයේ ඇති බැවින් ඒවා කොමිෂන් සභාවට ගෙන්වා ගෙන අනතුරුව අපහරණය කමිටුවක් පත් කොට එමඟින් ලබා දෙන නිර්දේශ මත කටයුතු කරනු ලැබේ. | අධිකරණමය කටයුතුවලින් පසු නඩු තීන්දුව ලැබීමෙන් අනතුරුව හෝ අභියාචනා අවසන් වීමෙන් අනතුරුව එම ගොනුවලට අදාලව පවතින නඩු භාණ්ඩ, නඩු භාණ්ඩ ශේෂයෙන් ඉවත් කළ යුතු වේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කොමිෂන් සභාවේ සිවිල් කාර්ය මණ්ඩල තොරතුරු අනුව 2021 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 32 ක්ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 212 ක්ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 117 ක්ද හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 50 ක් පැවතුණි. විමර්ශණ කාර්ය මණ්ඩල තොරතුරු අනුව එම කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 15 ක් පැවතුණි. | නව තනතුරු සඳහා බඳවා ගැනීම රජය මඟින් තාවකාලිකව අත්හිටුවා ඇත. ඒ අනුව මෙම කොමිෂන් සභාවට අවශ්‍ය නිලධාරීන් ලබා දෙන මෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර තිබුණද මේ දක්වා නිලධාරීන් ලබාදී නොමැත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |